හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

බල්ලන් සමග සටන් කර බැටළු පැටවින් බේරාගැනීමටත් බැටලු පැටවුන් සමග සටන් කර උන් බේරා ගැනීමත් එකම සිදු වීමක් නොවේ. එසේම ලෙඩ රෝග (රෝගාබාද/විසබීජ) සමග සටන්කර රෝගින් බේරා ගැනීමත්, රෝගින්/ (ගිලන් වූවන්) සමග සටන් කර ඔවින් (බේරා ගැනීමත්)/ ජීවත් කරවන්ට වෙර දැරීමත් එකක් නොවේ. මේ වැකි යුගල දෙකේම දෙවැනි වැකිය හාස්‍ය ජනකය.....

උක්තාඛ්‍යාත සම්බන්ධයත් උක්තානුක්ත බේදයත් නොසලකා ලියන, න/ණ - ල/ළ - ශ/ෂ මාරුකොට ලියන ලේඛකයින් සංඛ්‍යාව දවසින් දවස වැඩි වන්නේ ඇයි?

වියරනය නිවැරදිව දැනගෙන කිසිවක් නොලියා සිටින කෙනාට වඩා, වරදදැ - වරදදැ හෝ යමක් ලියන කෙනා ලෝකයට අවශ්‍යය. ලෝකය ඉතත් වන්නේ ඔහු නිසාය.

ඒ ගැන අදහස් ඉදිරිපත් කරන ලිපියේ මුල් කොටසයි මේ.

මෙය 2005.10.23 දිවයින ඉරිදා සංග්‍රහයේ පල වූ 'මෙන්න මෙන්න මගේ වැරදි - දෙන්න දෙන්න ජේ. පී. කම්' ලිපිය ගැනයි.

'ඔහු සමග අධිකරණයට පැමිණි පිරිස... ලාල් එනතුරු බලා සිටියේය. ඒ පිරිස අතරේ සිටි .... මළුවින් සිල්ලා මඟහා... ලාල්ගේ දෑත් අල්ලා සුභ පතා... ඔහු වැළඳ ගත්තේය.

මේ වැකි දෙකෙන් පලමු වැන්න 'ලාල් සමග අධිකරණයට පැමිණි පිරිස... ඔහු එනතුරු බලා සිටියේය. ඒ පිරිස සිටියේය.' යනුවෙන් වෙනස් වූ ඊටය නිවැරදි වැකියක් වන්නේ. ලේඛකයා කියන්නේ කුමඳක දැයි අපට තේරුම් ගත හැකිය. එහෙත් වැකියේ ගැලපීම වැරදිය. 'ඔහු සමග පැමිණි පිරිස ලාල් එන තුරු බලා සිටියේය' යන්න කියවන්නා අතරමං කරන වැකියකි. වැළඳැද යන්නේ 'ල' මාරු වී ඇත. ඉඟ/සුඟ/සුබ යන තුනින් මෙතනට වඩාත් ගැලපෙන්නේ සුඟ දැ? සුබ දැ? සමහරු සුබ, පලය, බය, බාගය, බාල යන්නේ වචන සේ සලකති.

'ඔහු කට කොණකින් සිනා සුගේ ය; තුන් කොන් මන්ත්‍රනයේ 'කොන්' දෙන මාරු වෙලා යන්නේ 'කොනේ' නිවැරදි නම් මෙතන 'කොණ' වැරදිය. 'පත් කරන්නට යෙදුන බව' යන්න යෙදුණ බව/ යෙදුණු බව වීය යුතුය.

දිවයින තුළ වාසය කරන කාලය තුළ පමණක්ද එම ප්‍රදේශ වාසීන්ට ඔබගේ සේවය ලැබෙන තුරාවට පමණක් ද' යන වැකියේ දෙපලකම ඇති 'පමණක් ද' යන වචනය එම වැකියේ අදහස අවිලි කරයි; 'තුරු' යන නිපාතය 'තුරා' වෙතත් එය තුරාවට, තුරාවෙන්, තුරාවක් ආදී වශයෙන් වරනැගිය නොහැකිය.

'ඔහු පිටු පෙරලා බැලුවේය' මෙය 'පෙරළා' වීය යුතුය.

'...බහුතරයක්... ලයිස්තුවට අයත් නොවූවන් වීය.' මෙහි උක්තය 'නොවූවෝ/නුවූවෝ' ය. ඒ අනුව ආඛ්‍යාතය 'වූහ' ය.

'දරුනු ගනයේ පාතාල නායකයන්..' යන්න 'දරුණු ගණයේ' වීය යුතුය.

'එක්සත් ජාතික පක්ෂය වීසින්... සාම වීනිසුරුකම් ප්‍රදානය කළේය; මේ වැකියට වීසින් යෙදීම වැරදිය.

'පසු ගිය දිනවල එපාපයට මංමාවත්වල පෝසටර් අලවා තිබීණි. මෙය 'එපාපයට එරෙහිව' යනුවෙන් සකස් වීය යුතුය; නොහොත් 'එපාපයට' යන්න ඇස්තේ 'ල'යන්නයි. '....රජයට ද වුදීපයෙකු වන්නට සිදුවීය.' මෙය 'වුදීයකු වන්නට සිදු වීය' වීය යුතුය.

'ප්‍රධාන සැක කරුවකු' ලෙස... ලාල් පීරිස් නම් කර තිබෙන බවටත්... මත් ද්‍රව්‍ය නාශක අංශය ප්‍රකාශ කරයි.' යන්න 'සැක කරුවකු ලෙස... නම් කර තිබෙන බවත් වීය යුතුය. ප්‍රධාන පෙළේ මත් ද්‍රව්‍ය ප්‍රවාහකයෙක් ලෙස... ලැයිස්තු ගතව සිටින ලාල් පීරිස් නොහොත් කුඩු ලාල් සමග පොලිස් නිලධාරීන් බොහෝ දෙනෙකු සමීප සම්බන්ධතා පවත්වති. මෙහි ඇති 'නොහොත්' නිසා ලාල් පීරිසුත් කුඩු ලාලුත් දෙදෙනෙකු ලෙස සැලකීමට සිදු වේ. මෙම වැකිය '..ප්‍රවාහකයෙකු ලෙස... මෙවිත් කුඩු ලාල් සමග පොලිස් නිලධාරීහු බොහෝ දෙනෙක් සමීප සම්බන්ධතා පවත්වති' යනුවෙන් සකස් වීය යුතුය.

ඒ ලිපිය ගැන වීමසුම එතනින් නවතා 2003.07.27 දිවයින ඉරිදා සංග්‍රහයේ පල වූ 'දොස්තර මහත්වරුන්ට එරෙහිව අධිකරණයට ගිය ගොවි මහත්තයා' ලිපිය ගනිමු.

'... බැත සපයන ගොවියා දෙවීයෙකි. ගිලන් වූවන් සමග සටන් කර ඔවුන් ජීවත් කරවන්නට වෙර දරන වෛද්‍යවරයාද දෙවීයෙකි. එ බැවීන් මොලොව දී... දැක ගත හැකි දෙවීවරු දෙදෙනෙක් ලෙස ගොවීයාත් වෛද්‍යවරයාත් හැඳින්වූවොට වරදක් නැත. දෙවීයන් බඳු වූවත් ඔවුන් ද මිනිසුන්ය.

බල්ලන් සමග සටන් කර බැටළු පැටවින් බේරාගැනීමටත් බැටලු පැටවුන් සමග සටන් කර උන් බේරා ගැනීමත් එකම සිදු වීමක් නොවේ. එසේම ලෙඩ රෝග (රෝගාබාද/විසබීජ) සමග සටන්කර රෝගින් බේරා ගැනීමත්, රෝගින්/ (ගිලන් වූවන්) සමග සටන් කර ඔවින් (බේරා ගැනීමත්)/ ජීවත් කරවන්ට වෙර දැරීමත් එකක් නොවේ. මේ වැකි යුගල දෙකේම දෙවැනි වැකිය හාස්‍ය ජනකය.

ළමයා - ලිම්බාන (ළිඳට බාන ඉනුව - ළිං බහන - ළිම්බහන - ළිම්බාන) වැනි පද ළමයා ළිම්බාන යනුවෙන් ලිවීම වැරදි ලෙස නොසැලකිය හැක්කේ මූර්ධජ අකුරු නොලියන පිරිසක් සිටින නිසාය. එහෙත් 'මේ ලොව - ලංකාව වැනි පද' මෙලොව - ළංකාව යනුවෙන් ලිවීම නම් කිසි සේත්ම අනුමත කල නොහැකිය.

'දෙවීයන් බඳු වූවත්' යන්න නිවැරදිව ලියා, 'දෙවීවරු දෙදෙනෙක් ලෙස - මවුන්ද මිනිසුන්ය' යන තැන වැරදියට ලියා ඇත්තේ ඇයි ? උක්තානුක්ත බේදය සැලකුවත් නොසැලකුවත් වරදක් නැතැයි සිතන නිසාද ? නොහොත් නොදැන්නා කම නිසා ද ? (යතුරු දොස් ද ඇතැම් ඊට මීට හේතු වේ)

'දෙවීවරුන් දෙදෙනෙකු ලෙස, (ඔහුද) ඔවුහු ද මිනිස්සු (වෙති)/ය යනුවෙන් නිවැරදිව ලිවීය යුතු වූ ඒ වැකිවලින් දෙදෙනට/ කියන්නට තනන අදහස තේරුම් ගත හැකිය. 'සිංහ-ඹුව-මර' යන පද තුනෙන් දීමට තනන අදහස වුවද අපට තේරුම් ගත හැකිය. දැන් දැන් උක්තාඛ්‍යාත සම්බන්ධය (ළමයා මිනිසා-ළමයි මිනයි) හෝ උක්තානුක්ත බේදය (බල්ලකු/බල්ලන් බුරයි) සලකා ලියන ලේඛකයින් ඇත්තේ 25%ක් තරම් වන සංඛ්‍යාවකැයි සිතේ. මේ තත්වය ඉක්මනින් වෙනස් වීය යුතුයයි සිතමි.

දැන් අපි අපේ සන්නස දෙසට හැරෙමු.

බාසා රීතියක් නොවෙතත් සොලෝ ගී පද ලිවීමේදී සකු වචන බැහැර කිරීම හෝ සකු වචන වලට සිංහල වෙස් ගැන්වීම පිලිගත් සම්ප්‍රදායක් ලෙස සැලකේ. හංස සංදේශය පරකුම්බා සිරිත වැනි සමහර පොත් මේ සම්ප්‍රදායට පිටුපා ඇත. බුදුඟනාලංකාරයේ 'පූර්ණ කාශ්‍යප, කුකුද කච්චායන, අජිත කේෂ කම්බලී, නිගණ්ඨ නාතපුත්‍ර වැනි නම් ලියා ඇත්තේ 'පූරන කුසුබු, කුකුද කසසින්, අජිත කේස කම්බලී, නිගටනාතපුත් යනුවෙනි. කිසිදු නීතියක් හෝ රීතියක් නැතිව සිංහල වෙස් ගැන්නූ වචන ද ඇති බව පිලිගැනීමට සිදු වෙතත් ඒවා අද මුල් බසස ගෙන ඇත. පාණ්ඩු කම්බල ශෛල ආසනය - පඬුපුල් අස්න/ පඬු ඇඹුල ඒම එක් නිදසුනකි.

කෙසේ වෙතත් ඉඟ/සුඟ/සුබ, ධන/දන, ඝන/ගන, ඵල/පල, භව/බව, භය/(ඕය) බය, ඡේදය/ඡේදය, (ඡේධය යනුවෙන් ලියන අයත් සිටිති) භාගය/බාගය, ධාතු/දාතු, ධීවර/(ඳිහිවර) දීවර වැනි වචන වල මහප්‍රානය නැතිව ලිවීම බොහෝ දෙනාගේ සිරිත ඒ අත්තේ අපේ කටට මහප්‍රාන නුහුරු නිසා යයි සිතමි.

කේමා, ගෝසාව, චන්දෙ, ඝප්ජායනාව, ගුඩ, තූපාරාමෙ, පූරය, පලාපල, බූගෝල්ල ඒදාව අපට නිතර අසෙසන සැටි අපි දනිමු. අපේ කනට එහි අමුත්තක් නැත.

මේ බව දැන දැනත් 'බුදිමින් ඵල රිසි සේ, භව ගන'ඳුර, ශ්‍රෙෂ්ඨ ඖෂධයකි වැනි සකු වචන අමු අමුවේ ගීයට කවියට එක් කිරීම ගැන යලි සලකා බැලිය යුතුය. සපත්තු කලිසම් හදට තිබීමේ කරදරයක් නොවැ.!

'ඒ දහමේ අසිරිය මොන තරම් පරාර්ථකාමී ද? දහමක අසිරියක් පරාර්ථකාමී වීම කෙබඳු දැයි පාඨකයා අන්ද මන්ද වෙතැයි සිතමි. දහමක් පරාර්ථ කාමී වීම තේරුමී ගත හැකිය.

'සය' හැදෙන්නේ සස් + අ - පස, සත් + අ - සත හැදෙන විදියට නොවේ. ස + අ (යි ආගම ඒ) ය වේ. සවන පැරකුම්බා, සබස් පරමිසුරු, ස අවුරුදු (සාවුරුදු වේ. දෑ අවුරුද්දත්, සා අවුරුද්දත් වැරදි වහරකි. 'ස' යන්නේ ඝාබා, ඛඩගින්න, තරම්, දුර්වික්සය යන තේරුම් ඇති ගද්‍ය කන්ඩයකැයි සිතෙන ඒ ප්‍රබන්දය යලිත් කියවා බැලීම යුතුය. අඟට 'බුදු ඝිමියනි' යනුවෙන් බුදුන් අමතා ඇතත් එය ලියා ඇත්තේ බුදුන් සඳහා නොවේ.

'සියොතුන් ගී ගයයි - සමනලයින් මල් සිඹ සිඹ යයි - දෙවඟන ගස් අතුරින් බලති.' වැනි වැකි, පසේ පන්තියේ ලමයෙකුගේ රචනයකද දැකිය හැකිය. වළින්නකු අතුරින් වැටීම, ගස් අතුරුන් එකක් මීයක් තිබීම, බල්ලන් අතුරින් එකකු කෙළිරි ගෑම සිදුවීය හැකිය. ගස් අතරින් එළි බැලීම ඊට වෙනස්ය. ඊයහමේ හැටියට අකුරු-අතර පද දෙකේ තේරුම් දෙකක ඇති බව පෙනේ. මෙය යතුරු ලියමිනේ දොසක් වන්නට ද බැරි නැත.

මංගල රාජියේ 'පාණය ද ලුණු කොට සුරැකිය' යන්නේ 'පාණිය' යතුරු ලියමිනේ දී සිදු වූ දොසක් බව පෙනේ. ඒ වැකියේ අදහස 'මම මගේ පන ද ලුණු කොට තැකීමි' යයි සිතමි. (ලුණු) ලුහු කොට තැකීම සත් වහරයි. අයය කියන්නට තනන අදහස මා තේරුම් ගත් හැටි හරි නම් මම ඒ අදහස මෙසේ කියමි.

ඔඟුල් දා උදහසකැක්කේ (උදසනක් සේ රෑට මේ ගැන සිතීමට වෙලාවක් නැත)

මා පන දෙවෙනි කොට - රැක ගත් කේක් ගෙඩිය පූජා කරමි බැතියන් අද - ඔහු එය කපා තොල ගගා රස විඳින හැටි ! අහා, ඔට දැන් මැවීලා පෙනේ.

සිව් වසරක පටන් - කුතුහලයෙන් යුතුව පිරිමඳමින් ඔබා බලමින් සිටි - මල්ල ලිහනා දිනේ අද මගේ සිහිනිය සැබෑ වෙයි. කුඹකින් කුඹක් වේවිදැ ?

(මේ ලිපිය කියවා සිත් රිදවා ගන්නේ නැතිව තව තවත් දිරිමත්ව අපූරු අදහස් දොවා දෙන ලෙසත් මා වැරදියට තේරුම් නොගන්නා ලෙසත් අදාල ලේඛකයින්ගෙනුත් ලේඛිකාවන්ගෙනුත් මෙත් සිත් පෙරවූ කොට ඉල්ලා සිටිමි.)

මේ ලිපියේ දෙවන කොටස ලබන කලබේ

සුභාෂිතයෙන්

පිරිවර සෙන් රකිනා පිනිස නිරතුරු
පෙර නියමින් හිරිඳෝ රැගනිති පඬුරු
සිය ගුනයෙන් වසිනුව වැසි මෙදියතුරු
සිය කිරනින් දෙරනත රස ගනිය හිරු

පදාවලිය

නිරතුරු - පිරිවර සෙන් - රකිනා පිනිස - පෙර නියමින් - පඬුරු ඇරැ ගනිති - සිය ගුනයෙන් - වැසි වසිනුව - හිරු - සිය කිරනින් - දෙරනත රස ගනිය

අදහස

නිරන්තරයෙන් (හැම වීටම) තම පිරිවර සේනාව රකිනු (නඩත්තු කරනු) පිනිස, පෙර සිටි රජුන්ගේ පටන් පැවතගෙන එන ඒදියට, රජවරු බදු අය කර (බදු) ගනිති. එය හරියට ලෝකය අතර /පුරා (පොලවට) සිය ගුනයකින් වැසී කොට (දෙතුන් ගුනයකින් නොවේ) වැසි වස්සනු පිනිස ඉරු (හෙමේ) තමාගේ රස්නයෙන් (අව්වෙන්) පොලවේ ඇති රසය (ජලය) ඇදගන්නාක් වැනිය.

පැහැදුම

නි + අතුරු - නිරතුරු (අතරක් නැතිව - නොකඩවා)
තර + ඉඳු - නරිඳු - නිරිඳු + ඕ - නිරිඳෝ
ඇරැ + ගනිති - රැගනිති (අරගනිති)
දෙරන + අත - දෙරනත (ඕනත, නලලත නලෙති)

එදා රජවරුන් අය බදු ගත්තේ සම්මතයේ පැවති වීදියටයි. ඔවින් එසේ අය බදු ගත්තේ සේනාව නඩත්තු කිරීමටයි. මං මාවත් පාලම් වැව් පිලිසකර (අලුත් වැඩියා) කිරීම රට වාසියන් ශ්‍රමදානයෙන් කල බව පෙනේ. දෙරනත රස යනු පොලෝ දිය (පොලවේ වතුර) යි. ගංගා ඇල දොල වැව් පොකුණු ද ඊට අයත්ය.